# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1936/4 – 2015 ඔක්තෝබර් 12 වැනි සඳුදා – 2015.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2015 අංක 163 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/96/FR/473.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උදු2/5/10/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 30 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, උඩුදුම්බර.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙක කෝරළේ සුළු කොට්ඨාසයේ කරඹකැටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පුස්සේඇල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ 6140 සහ 2010.10.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3720ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 01 – වින්චිගිල්ඩ්පාක් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.3720**

උතුරට: මූ.පි. මහ 1930 හි කැබලි අංක 28, මූ.පි. මහ 5588 හි කැබලි අංක 01 සහ මූ.පි. මහ 1930 හි කැබලි අංක 23; නැගෙනහිරට: මූ.පි. මහ 1930 හි කැබලි අංක 23, මූ.පි. මහ 5767 හි කැබලි අංක 01 සහ මූ.පි. මහ 5587 හි කැබලි අංක 01; දකුණට: මූ.පි. මහ 5587 හි කැබලි අංක 01 සහ මූ.පි. මහ 1930 හි කැබලි අංක 29; බටහිරට: මූ.පි. මහ 1930 හි කැබලි අංක 29 සහ 28.

10 - 948

1A – G22455 – 32 (2015/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*